# බුද්ධාංජලී වන්දනා අයතනයේ දඹදිව වන්දනා ගමන් සඳහා නියමයන් හා කොන්දේසි.

බුද්ධාංජලී වන්දනා අයතනය විසින් සංවිධානය කරනු ලබන දඹදිව වන්දනා ගමන් සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන ඔබ, පහත සඳහන් නියමයන් හා කොන්දේසි හොඳින් කියවා තේරුම් ගෙන ඒවාට එකඟ විය යුතුය. මෙම නියමයන් හා කොන්දේසි, වන්දනා ගමන සාර්ථකව හා සුරක්ෂිතව සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

1. වෙන්කරවා ගැනීම් සහ ගෙවීම්

    1. අයදුම්පත්‍රය: වන්දනා ගමන සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන සියලු දෙනා නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.
    2. මුදල් ගෙවීම:

    1) වන්දනා ගමන වෙන්කරවා ගැනීමේදී, මුළු ගාස්තුවෙන් රු.30000/- පෙරගෙවීමක් කළ යුතුය. මෙම පෙරගෙවීමෙන් අඩක් ආපසු ගෙවිය නොහැක.

    2) ඉතිරි මුදල වන්දනා ගමන ආරම්භ කිරීමට දින 20 කට පෙර සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ යුතුය.

    3) නියමිත දිනට මුදල් ගෙවීම් සිදු නොකළහොත්, ඔබගේ වෙන්කරවා ගැනීම අවලංගු කිරීමට ආයතනයට අයිතිය ඇත.

    4) ගාස්තු වෙනස්වීම: ගුවන් ගමන් ගාස්තු, වීසා ගාස්තු, ඉන්ධන මිල, හෝටල් ගාස්තු හෝ විදේශ විනිමය අනුපාතවල සිදුවන වෙනස්වීම් මත වන්දනා ගමනේ මුළු ගාස්තුව වෙනස් වීමට ඉඩ ඇත. මෙවැනි වෙනස්වීම් සිදුවුවහොත්, ඒ පිළිබඳව කල්තියා ඔබව දැනුවත් කරනු ලැබේ.

2. අවලංගු කිරීම් සහ මුදල් ආපසු ගෙවීම්

    1. අයදුම්කරු විසින් අවලංගු කිරීම:

        1) වන්දනා ගමන ආරම්භ කිරීමට දින 35 කට වඩා වැඩි කාලයක් තිබියදී අවලංගු කරන්නේ නම්, පෙරගෙවීම හැර වෙනත් ගෙවීම් (ඇත්නම්) ආපසු ගෙවීම පිළිබඳව සලකා බැලේ.

        2) වන්දනා ගමන ආරම්භ කිරීමට දින 20 ට අඩුවෙන් තිබියදී අවලංගු කරන්නේ නම්, කිසිදු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.

        3) හදිසි අවස්ථාවකදී, ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළහොත්, එක් එක් සිද්ධිය අනුව සලකා බැලීමක් කළ හැකිය.

    2. ආයතනය විසින් අවලංගු කිරීම:

        1) අපහසුතා හෝ අනපේක්ෂිත තත්වයන් (උදා: ස්වභාවික විපත්, ආරක්ෂක තර්ජන, ගුවන් ගමන් අවලංගු වීම්, සෞඛ්‍ය හදිසි අවස්ථා) හේතුවෙන් වන්දනා ගමන අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට ආයතනයට අයිතිය ඇත.

        2) ආයතනය විසින් වන්දනා ගමනක් අවලංගු කරන්නේ නම්, ගෙවන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවනු ලැබේ, නැතහොත් වෙනත් වන්දනා ගමනකට මාරු වීමට අවස්ථාව ලබා දෙනු ඇත.

3. වීසා සහ විදේශ ගමන් බලපත්‍ර

    1. වගකීම: විදේශ ගමන් බලපත්‍රයක් වලංගු භාවය (සංචාරය අවසන් වී මාස 6කට වැඩි කාලයක් වලංගු විය යුතුය)
    2. සහාය: වීසා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ආයතනය විසින් සිදු කරනු ඇත. කෙසේ වෙතත්, වීසා ලබා දීම පිළිබඳ අවසන් තීරණය අදාළ රටේ තානාපති කාර්යාලය සතු වේ.

4. සෞඛ්‍ය සහ ආරක්ෂාව

1. වෛද්‍ය තොරතුරු: අයදුම්පත්‍රයේ ඔබගේ සෞඛ්‍ය තොරතුරු නිවැරදිව හා සම්පූර්ණයෙන් සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.
2. වෛද්‍ය ප්‍රතිකාර: වන්දනා ගමන අතරතුරදී යම් හදිසි වෛද්‍ය තත්වයක් ඇති වුවහොත්, අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට ආයතනය කටයුතු කරනු ඇත. (බරපතල මට්ටමේ නම් ඊට අදාළ වියදම් අයදුම්කරු විසින් දැරිය යුතුය.)
3. රක්ෂණය: විදේශ සංචාර සඳහා වන රක්ෂණය සකසා දෙනු ලැබේ.
4. ආරක්ෂක උපදෙස්: වන්දනා ගමන අතරතුරදී ආයතනයේ නියෝජිතයින් විසින් ලබා දෙන ආරක්ෂක උපදෙස් හා මාර්ගෝපදේශ නිසි ලෙස පිළිපැදිය යුතුය.

5. වගකීම් සහ සීමාවන්

1. ප්‍රවාහනය සහ නවාතැන්: ගුවන් සේවා, හෝටල්, ප්‍රවාහන ආයතන වැනි තෙවන පාර්ශවයන් විසින් සපයනු ලබන සේවාවන්හි ඇතිවිය හැකි ප්‍රමාදයන්, අවලංගු කිරීම් හෝ වෙනස්වීම් සඳහා ආයතනය වගකිව යුතු නොවේ. කෙසේ වෙතත්, එවැනි අවස්ථාවලදී ඇතිවන අපහසුතා අවම කිරීමට ආයතනය උපරිමයෙන් කටයුතු කරනු ඇත.
2. පෞද්ගලික බඩු බාහිරාදිය: වන්දනා ගමන අතරතුරදී ඔබගේ පෞද්ගලික බඩු බාහිරාදිය පිළිබඳ වගකීම ඔබ සතු වේ. ඒවා අහිමි වීම, සොරකම් වීම හෝ හානි වීම සම්බන්ධයෙන් ආයතනය වගකිව යුතු නොවේ.
3. හැසිරීම: වන්දනා ගමන අතරතුරදී අන් අයට බාධාවක් නොවන අයුරින් හා බුද්ධශාසනික ගරුත්වයට හානියක් නොවන අයුරින් කටයුතු කිරීමට ඔබ බැඳී සිටී. විනය විරෝධී හෝ නීති විරෝධී ක්‍රියාවන්හි නිරත වුවහොත්, අදාළ පුද්ගලයා වන්දනා කණ්ඩායමෙන් ඉවත් කිරීමට ආයතනයට අයිතිය ඇත. එවැනි අවස්ථාවකදී ගෙවන ලද මුදල් ආපසු ගෙවනු නොලැබේ.
4. ගමන් විස්තරය වෙනස් කිරීම: අනපේක්ෂිත තත්වයන් හෝ හදිසි අවශ්‍යතා මත ගමන් විස්තරයේ සුළු වෙනස්කම් සිදු කිරීමට ආයතනයට අයිතිය ඇත. එවැනි වෙනස්කම් සිදුවුවහොත් ඒ පිළිබඳව ඔබව කල්තියා දැනුවත් කරනු ලැබේ.

5. පොදු කරුණු

1. දේශගුණය සහ සංස්කෘතිය: දඹදිව පවතින දේශගුණික තත්ත්වයන් සහ දේශීය සංස්කෘතික සිරිත් විරිත් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීම වැදගත් වේ.
2. ආහාර: ආයතනය විසින් සපයන ආහාර සපයනු ලබන්නේ ශ්‍රී ලාංකික බෞද්ධයින්ට සුදුසු අයුරිනි. විශේෂ ආහාර අවශ්‍යතා ඇත්නම්, අයදුම්පත්‍රයේ සඳහන් කර කල්තියා දැනුම් දිය යුතුය.
3. සන්නිවේදනය: වන්දනා ගමන අතරතුරදී අවශ්‍ය සන්නිවේදන කටයුතු සඳහා දේශීය දුරකථන සේවා හෝ වෙනත් විකල්ප පිළිබඳව ආයතනයෙන් විමසිය හැකිය.
4. මෙම නියමයන් හා කොන්දේසි කියවා තේරුම් ගත් බවත්, ඒවාට එකඟ වන බවත් අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් ඔබ සහතික කරයි.

බුද්ධාංජලී වන්දනා අයතනය
සද්ධර්මාකර විද්‍යායතන පිරිවෙන
පින්වත්ත-පානදුර
0763914316 / buddhanjalitravel@gmail.com